## වියළි කලාපයේ අලි මිනිස් ගැටුම පාලනය සඳහා ගත හැකි ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනයක්

*ජයසූරිය කේ.ඒ.ජේ.එස් [1] ජයසුන්දර ජේ.එම්.එස්.බී [2]*

ශ්‍රී ලංකාව තුළ වර්තමානයේදී දක්නට ලැබෙන ප්‍රබලම පාරිසරික ගැටලුවක් ලෙස ජෛව විවිධත්වය කෙරෙහි මිනිසා විසින් ඇති කරන බලපෑම් පෙන්වා දිය හැකිය. මේ අතුරින් ග්‍රාමීය ප්‍රදේශ ආසන්නයෙන් දෛනිකව අසන්නට දකින්නට ඇති ප්‍රධානම ගැටලුවක් ලෙස අලි- මිනිස් ගැටුම් හඳුනා ගත හැකිය. මෙම ගැටලුවේදී සතුන් මෙන්ම මිනිසාද විවිධ පීඩාකාරී අත්දැකීම් වලට ගොදුරු වේ. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ප්‍රදේශ කිහිපයක ප්‍රබල ලෙස පවතින අලි මිනිස් ගැටුම ඇති වීමට බලපාන ලද ප්‍රධාන හේතු හඳුනාගනිමින් එකී ගැටලු පාලනය කර ගැනීම සඳහා යොදා ගත හැකි විවිධ ක්‍රමවේදයන් මොනවාද යන්න අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ශ්‍රී ලංකාවේ වියළි කලාපයට අයත් රජරට පුරාණ වැව්ගම්මාන ඇතුලත් වන කහටගස්දිගිලිය සහ මාදුරුඔය රක්ෂිතයට සමීප පුරාණ ආදිවාසී ගම්මානයක් වන හෙන්නානිගල සහ මෑත කාලයේ මහවැලි ව්‍යාපාරය මගින් නැවත පදිංචි කරන ලද මහවැලි ගම්මාන ඇතුළත් හෙන්නානිගල වනජීවී කලාපයන් ද්විත්වය තුළ මෙකී වනඅලි සහ මිනිසා අතර පවතින සට්ඨනය අධ්‍යයනය කර තිබේ. මේ සඳහා පර්යේෂණ ක්‍රමවේදයන් වශයෙන් ප්‍රාථමික මූලාශ්‍රයන් ලෙස සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමය භාවිතා කරමින් ක්ෂේත්‍රයට ගොස් දත්ත රැස් කරගනු ලැබූ අතර ඊට අමතරව සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදයද මේ සඳහා භාවිතා කරන ලදී. එමෙන්ම ද්විතීයික මූලාශ්‍ර වශයෙන් 2011 වන අලි සංගණන වාර්තාව පරිශීලනය කරන ලදී. වර්තමානයේදී මානවයාට පමණක් සීමා නොවන වනඅලින් තුළද පෙන්නුම් කරන චර්යාමය වෙනස්කම් මේ සඳහා හේතුවී ඇති බව පෙන්වා දිය හැකිය. වනඅලින්ගේ ආහාර, ආහාර රටාව ආදීය අතීතයට සාපේක්ෂව අද වන විට වෙනස්වී ඇති බව පෙන්වාදිය හැකිය. අතීතයේදී මයිල, වෙළං ආදී ශාක ආහාර ලෙස ගැනීමට අලින් වැඩි උනන්දුවක් දැක්වුවද වර්තමානය වන විට බඩඉරිගු, වී සහ විවිධ එළවළු වගාවන් සඳහා වැඩි රුචිකත්වයක් දක්වන බව හඳුනාගත හැකිය. මිනිසා විසින් හේන් ආශ්‍රිත තම වගාවන් ලෙස සිදුකළ මෙකී විවිධ බෝග කෙරෙහි අලින් ගිජුවීම තුළ ක්‍රමයෙන් කල්යත්ම ඔවුන්ගේ ප්‍රධාන ආහාර රටාවන් තුළට ඒවා අන්තර ගත වී ඇත. හෙන්නානිගල සාම්ප්‍රදායික ආදිවාසී ගම්මාන තුළ පැවති පහන් පත්තුකිරීම, ලුණු ගොටු තැබීම ආදී සාම්ප්‍රදායික ක්‍රමශිල්පයන් පිළිබඳවද මෙකී අධ්‍යයනය තුළින් කරුණු අනාවරණය විය. හන ශාකය, තල් ශාකය වැනි වගාක්‍රම සහ මී මැසි පාලනය තුළින් අලින් ගැම්වැදීම පාලනය කර ගැනීමට හැකියාව පවතින බවත් මෙකී ක්‍රම තුළින් ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය නගා සිටුවීම සඳහා කටයුතු කළහැකි බවත් හඳුනාගත හැකිවිය. වගාභූමි තුළට විදුලිය සහ ස්ථිර ජලසැපයුම් ආදී ආර්ථිකමය වටිනාකමක් නිර්මාණය වීම වළක්වමින් ජාතික ඉඩම් ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම වැදගත්වේ. වන සතුන්ට සහ මිනිසාට එක්ව වාසය කිරීමට නොහැකි බැවින් අලි හා වනසතුන් සඳහා අයිති වනභූමි කලාපයන් අනාගතයේදී එම වනාන්තරවල සත්තව සහනයට සාපේක්ෂව වර්ධනය කළ යුතු අතර ජනාවාස, වනභූමි සහ වගාභූමි අතර පැහැදිලි වෙනසක් සහ දුරස්ථභවක් නිර්මාණය කළ යුතු බව පැහැදිලි වේ.

**ප්‍රමුඛ පද -** *අලි මිනිස් ගැටුම, වියළි කලාපය, ඉඩම් ප්‍රතිපත්ති, පෙරදිග දැනුම් පද්ධතිය, සාම්ප්‍රදායික ක්‍රම*

[1] පාරිසරික කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලේ. jayasankajs11@gmail.com

[2] පාරිසරික කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලේ.